ප්‍රකාශය 2017 මැයි

පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානය සඳහා නැවත මුල පිරීමේ අවශ්‍යතාව

යුද්ධය අවසන් කිරීමේ අට වන සංවත්සරය අර්ථාන්විත ප්‍රතිසන්ධානයක් ඇති කිරීමෙහි ලා අත් කර ගෙන තිබෙන ප්‍රගතිය ද ඒ පිළිබඳ අනාගත අපේක්ෂාවන් ද කෙරෙහි අපගේ අවධානය යොමු කරවයි. සංක්‍රාන්තික යුක්තිය හා ප්‍රතිසන්ධානය ආශ්‍රිත විවිධාකාර අභියෝග නො තකා හරිමින් මෑත වසරවල දී වැඩි අවධානයක් යොමු කර ඇත්තේ යුද්ධයේ අවසන් අදියර පිළිබඳව ය; විශේෂයෙන් ම දෙපාර්ශ්වයට ම එරෙහිව එල්ල වන ජාත්‍යන්තර අපරාධ චෝදනා, වග වන ලෙස කෙරෙන ඉල්ලීම සහ අදාළ විධික්‍රම හා යන්ත්‍රණය පිළිබඳව ය. එබැවින් බොහෝ ශ්‍රී ලාංකිකයෝ පිළිවෙළින් බලයට පත් ආණ්ඩු යටතේ දශක ගණනාවක් තිස්සේ සිදුව ඇති ව්‍යුහාත්මක අසාධාරණකම් ද දේශපාලනික ප්‍රචණ්ඩත්වය ද පාලනය සම්බන්ධ වෙනත් බරපතළ අසමත් වීම් ද කරණ කොට ගෙන ගැඹුරින් ම භේද භින්නව හා කෝපයට පත්ව සිටිති.

වර්තමාන ආණ්ඩුව බලයට පත්ව ගත වූ දෙවසර තුළ පාලනය සම්බන්ධ ප්‍රතිසංස්කරණ පූර්ණ ලෙස සාක්ෂාත් කිරීම දැඩි අභියෝගයකට ලක්ව තිබීමත් ප්‍රතිසන්ධානය වඩ වඩාත් මුදුන් පමුණුවා ගත නොහැකි දෙයක් බවට පත්ව තිබීමත් කනස්සල්ලට කරුණකි. මෙම තත්ත්වය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ, සංක්‍රාන්තික යුක්තිය හා පාලනය සම්බන්ධයෙන් 2015 දී දුන් පොරොන්දු කඩිනමින් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී වැඩසටහනක් දියත් කරන ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ සහ අගමැති රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවට බල කර සිටී. එම වැඩසටහන නිදහසෙන් පසු අපගේ ඉතිහාසයේ දී ඇති කර ගත් විශාලතම හා පුළුල්තම සන්ධානය වන 2015 විජයග්‍රාහී සන්ධානයේ අද්විතීයත්වය පදනම් කර ගත්තා වූත් සැබෑ ලෙස ම ජාතික වූත් වැඩසටහනක් විය යුතු ය. මෙම සැලැස්ම සහ මෙම ක්‍රියාකාරී වැඩසටහන ක්‍රියාත්මක කිරීම වඩාත් ම වැදගත් ජාතික ප්‍රමුඛතාව ලෙස සැලකිය යුතු අතර ඒ සඳහා මහජනතාව ප්‍රබල ලෙස දිරි ගන්වා ඔවුන්ගේ සහාය හා සහභාගිත්වය ලබා ගැනීම අනිවාර්ය වේ.

ගෙවී ගිය වසරවල දී ගැටුම් පරිණාමනය හා සාමය ගොඩ නැගීම සඳහා ලද අවස්ථා කිහිපයක් ම ශ්‍රී ලංකාවට මග හැරී ගියේ ය. යුද්ධය අවසානයේ දී ප්‍රතිසන්ධානය සඳහා ලද අවස්ථාව ඒකාධිපතිවාදී හා විජයෝත්සවවාදී වූත් ගොදුරු වූවන්ගේ හා පීඩාවට පත් ප්‍රජාවන්ගේ දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීම ගැන කිසි ම උනන්දුවක් නොදැක්වූවා වූත් තන්ත්‍රයක් විසින් නො තකා හරිනු ලැබිණ. ඒ වෙනුවට එම තන්ත්‍රය පෙර නුවූ විරූ මට්ටමින් හමුදාකරණයකට, දූෂණයකට හා ඥාති සංග්‍රහයකට ද විරුද්ධ මත පළ කිරීමේ හා කතා කිරීමේ නිදහස නොතකා හැරීමකට ද සුළුතරයන්ට එරෙහිව ප්‍රහාර එල්ල කිරීමකට ද දඬුවම් නොලැබීමේ සංස්කෘතිය තහවුරු කිරීමකට ද අනුග්‍රහ දක්වමින් ඒ සඳහා පෙරමුණ ගත්තේ ය. අතීතයේ සිදු වූ උල්ලංඝනයන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන බවට දුන් පොරොන්දු හුදෙක් පරීක්ෂණ හා විමර්ශන කොමිසම් පත් කිරීමේ ප්‍රයත්නයන්ට පමණක් සීමා වූ අතර සත්‍යය හා යුක්තිය සොයමින් සිටින දහස් ගණනක් වූ අපගේ පුරවැසි සගයන්ට පිළිතුරු දීමට එම කොමිසම් අසමත් වූයේ ය.

නව හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනික සංස්කෘතියක් ද අව්‍යාජ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ද සඳහා ප්‍රතිඥා දුන් පෙර නුවූ විරූ සන්ධානයකට ඡන්දය දෙමින් ශ්‍රී ලාංකිකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙම ඒකාධිපතිවාදය ප්‍රතික්ෂේප කරන අයුරු 2015 ජනවාරියේ දීත් අගෝස්තුවේ දීත් දැක ගත හැකි විය. වසර දෙකකටත් වඩා ගත වී ඇතත් මහජනතාවට දැනෙන ප්‍රත්‍යක්ෂ වෙනසක් සිදුව නැති තරම් හෙයින් වෙනස පිළිබඳ අපේක්ෂාව වේගයෙන් තුරන් වෙමින් පවතී. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ නීතිය බලාත්මක කිරීම යනාදි වශයෙන් මුල දී යම් ප්‍රගතියක් අත් කර ගත් නමුත් තමන්ගේ හා රටේ අනාගතය තීරණය කරන ප්‍රධාන පෙළේ ක්‍රියාවලිවලින් බොහෝ ශ්‍රී ලාංකිකයෝ තව මත් බැහැර කරනු ලැබ සිටිති. ශ්‍රී ලංකාව පුරා නොයෙක් තන්හි දී ගොදුරු වූවන් හා පීඩාවට පත් ප්‍රජාවන් විසින් අඛණ්ඩව පැවැත්වෙන විරෝධතා වහා අවධානය යොමු කළ යුතු බොහෝ ක්ෂේත්‍ර ද මේ ආණ්ඩුව හා මින් පෙර ආණ්ඩු අතර කිසිදු වෙනසක් නැති බවට වර්ධනය වන හැඟීම ද පෙන්නුම් කරන සංඥාවකි. මෑත මාසවල දී ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පුරවැසියන් සම්බන්ධ කර ගැනීම මුළුමනින් ම පාහේ

නතර කර දැමීමක් ද නීති හා ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ කටයුතු වඩ වඩාත් රහසිගතව සිදු වීමක් ද ඒ අතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා නිසි ක්‍රියාවලියට විනාශකාරී අන්දමින් බලපාන නීතිමය රාමු හඳුන්වා දීමක් ද දක්නට ලැබිණ. එපමණක් නො ව, ප්‍රතිසන්ධානය ගැන අතිශයෝක්තියෙන් කථා කරන නමුත් මේ ආණ්ඩුව තව මත් ප්‍රතිසන්ධානය හා සහජීවනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්තියක් වර්ධනය කර ගැනීම සඳහා සමාජයේ හරස්කඩක් සම්බන්ධ කර ගත් කතිකාවකට මුල පුරා නැත. මෙම තත්ත්වය තුළ ආණ්ඩුවට ඒ නිසා මතු වන සංකීර්ණතාවන්ට හා අභියෝගයන්ට මුහුණ දීමට සිදු වනු ඇති අතර එය ඒ බව වටහා ගනු ඇතැයි සිතිය හැකි ය. එපමණක් ද නො ව, ඉඩම් නිදහස් කිරීම හා බලාත්කාරී අතුරුදන් වීම් පිළිබඳ ගැටලුවලට විසඳුම් ලබා දීම වැනි විශ්වාසය ගොඩ නැගීමේ පියවරයන් කෙරෙහි මුල දී පැවති උද්‍යෝගය නැතිව ගොස් ඇති අතර අතුරුදන් වූවන්ගේ කාර්යාලය තව මත් පිහිටුවා නැත. සංක්‍රාන්තික යුක්තියට අදාළව නිර්මාණය කරන බවට 2015 දී ප්‍රතිඥා දුන් එක ද යන්ත්‍රණයක් වත් මේ දක්වා නිර්මාණය කර නැත.

දශක ගණනාවක් තිස්සේ පැතිර පැවති ප්‍රචණ්ඩත්වය ද අසාධාරණකම් ද නිසා හට ගත් තියුණු බෙදීම් හා අවිශ්වාසය තුරන් කළ හැකි පහසු විසඳුම් නො පවතී. ප්‍රතිසන්ධානය වනාහි වේදනාකාරී හා බෙදීම්වලට තුඩු දුන් අතීතය විමසා බැලීමෙන්, හඳුනා ගැනීමෙන් හා ඒත්තු ගැනීමෙන් සමන්විත දීර්ඝ වූත් දුෂ්කර වූත් ක්‍රියාවලියකි. එය වනාහි අවදානම්වලට මුහුණ දීමට හා පටු ආත්මාර්ථකාමී ආස්ථානයන් ඉක්මවා යාමට අධිෂ්ඨානවත් වූ ද අතිශයින් බෙදී ගිය ප්‍රජාවන් අතර විශ්වාසය ගොඩ නගමින් අවුල් සහගත අවධිවල දී හා ක්‍රියාවලිය තුළ දී පුරවැසියන්ට මග පෙන්වන්නා වූ ද දූරදර්ශී නායකයන් අවශ්‍ය කරන්නා වූ ක්‍රියාවලියකි. සන්ධාන ආණ්ඩුවේ දැවෙන අවශ්‍යතා සලකන විට ප්‍රතිසංස්කරණ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ කොටස් අතර පවත්නා දෙගිඩියාව සහ ඔවුන් එහි දී අතීතය සමග පොර බැදීම මවිතයට කරුණක් නො විය හැකි ය. එසේ වුව ද මහාපේක්ෂා ඇති කරන පොරොන්දු දුන් පශ්චාත් යුද වාතාවරණයක දී මේවා ඉක්මවා යන නායකත්වයක් නොමැති බව පැහැදිලිව පෙනෙන්නට තිබීම සහ ප්‍රතිසංස්කරණ සඳහා පවත්නා අසමසම අවස්ථාවක් අපතේ යැවීම සැබවින් ම අපේක්ෂා භංගත්වයටත් අසහනයටත් තුඩු දෙන්නක් වේ. දුන් පොරොන්දු රැකීම හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යළි පණ ගැන්වීම ජනාධිපති සිරිසේනගේත් අගමැති වික්‍රමසිංහගේත් වගකීමකි. මේ මොහොතේ අක්‍රිය හා උදාසීන වුව හොත් අර්ථාන්විත ප්‍රතිසන්ධානයක් පිළිබඳ බලාපොරොත්තුව බිඳ වැටී වඩාත් ප්‍රබල ඒකාධිපතිවාදයකට මග පෑදෙනු ඇත.